# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1966/2 - 2016 මැයි මස 09 වැනි සඳුදා - 2016.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2015 සැප්තැම්බර් මස 21 වැනි දිනැති අංක 1933/13 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2016 අප්‍රේල් මස 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2016 මැයි මස 04 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි අධිකරණ අමාත්‍ය (අංක 27) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි II වැනි අයිතයමට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

"12. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතට (2015 අංක 4) අදාළ සියළුම කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම ;

13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු ;

14. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම"

(ආ) එහි III වැනි තීරුවෙහි "මහා භාරකාර ආඥාපනත (1922 අංක 01)" යන්නට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් :-

"අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත (2015 අංක 4)"

05 - 700


1A - G 23409 — 416 (2016/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*